බත් පිඟානක් ලබාදෙන විට සිය නැගණියගේ අත මිරිකුවා යැයි කියා, ඥාති සොහොයුරාට තියුණු ආයුධයකින් ප්‍රහාර එල්ල කිරීමේ චෝදනාව මත, සැකකරුවෙකු පොලිස් අත්අඩංගුවට පත්ව තිබේ යැයි සිංහල භාෂා පුවත්පත් (සැප්තැම්බර් 22, 2023) වාර්තා කර තිබුණි.

එම පුවත් වාර්තාවන් පහත පරිදි දැක්විය හැක.

එහිදී එම පුවත වාර්තා කළ, අද පුවත් වාර්තාව එම පුවත පමණක් දක්වා තිබූ අතර, පුවත වාර්තා කළ අරුණ, කාටූනයක් ද සමගින් එම පුවත දක්වා තිබිණි. එසේම පුවත වාර්තා කළ දිනමිණ, පුවත සමඟින් ලේ වැකි කිණිස්සක රූපයක්ද දක්වා තිබිණි.

ඔබ සිතන ලෙසට,

1) මෙම අරුණ කාටූනය ඔස්සේ, අරුණ පුවත් වාර්තාවට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබා නොදෙන්නේ ද? ඒ ඔස්සේ මෙම පුවතින් දැක්වෙන අපරාධය සැහැල්ලු කොට නොදැක්වෙන්නේ ද?

2) දිනමිණ පුවත සමඟින්ද දැක් වී ඇති ලේ වැකි කිණිස්ස ඔස්සේ, පුවතට හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) බවක් ලබා නොදෙන්නේ ද? එයින් එම පුවතට, යම් අයෙකුට කම්පනයක් ගෙනදිය හැකි සංවේදී බවක් එක් නොකරන්නේ ද?

3) ඒ අනුව මෙම පුවත, තොරතුරු මූලික කරගනිමින්, වඩාත් යෝග්‍ය අයුරින් වාර්තා කොට ඇති බවට ඔබ තෝරා ගන්නේ කුමන පුවත් වාර්තාව(න්) ද?

